පේරාදෙණිය විශ්වවිද්‍යාලය

பேராதனைப் பல்கலைக்கழகம்

**UNIVERSITY OF PERADENIYA**

දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

தொடர் தொலைக் கல்வி நிலையம்

**CENTRE FOR DISTANCE AND CONTINUING EDUCATION**

ශාස්ත්‍රවේදී සාමාන්‍ය උපාධි පරීක්ෂණය (බාහිර) - 2017 දෙසැම්බර්

பொதுக்கலைமாணி பரீட்சை (வெளிவாரி) - 2017 டிசம்பர்

**GENERAL DEGREE EXAMINATION IN ARTS (EXTERNAL) – December 2017**

**Ex:- PHG II / දර්ශනය II**

(ආචාර ධර්ම)

ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

කාලය පැය තුනයි (03)

---

01. ආචාරධර්ම යන පදයෙහි තේරුම කුමක් ද?
    ප්‍රමාණික ආචාරධර්මය හා විස්තරාත්මක ආචාරධර්ම අතර වෙනස පැහැදිලි කරන්න.

02. ස්වභාවවාදි අභාසය යනු කුමක්ද? ජී.ඊ. මුවර්ගේ දර්ශනයෙහි ආචාරධර්මීය විශ්ලේෂණයට තිබෙන ස්ථානය කුමක්ද?

03. සදාචාර දර්ශනයට ප්ලේටෝ ගේ හෝ ඇරිස්ටෝටල්ගේ දායකත්වය සකච්ඡා කරන්න.

04. උපයෝගිතාවාදය යනු කුමක්ද? ආචාරධර්ම න්‍යායන් ලෙස උපයෝගිතාවාදයේ තිබෙන ප්‍රධාන ශක්තිය විස්තර කරන්න.

05. I. දඬුවම යනු කුමක්ද?
    II. මරණ දඬුවමෙන් අදහස් කරන්නේ කුමක්ද?
    III. අපරාධකරුවන් පුනරුත්තාපනය කිරීම වැදගත් වේ යයි ඔබ සිතන්නේද? ඔබේ පිළිතරට හේතු දක්වන්න.

06. "යුතුකම උදෙසා යුතුකම ඉටු කරන්න." ඉමානුවෙල් කාන්ට්ගේ ආචාර ධර්ම මත පදනම්ව මෙම ප්‍රකාශයේ වැදගත්කම විභාග කරන්න.

07. එක්කෝ
    සදාචාරය පිළිබඳ මාක්ස් වාදි දෘෂ්ටිකෝණයේ සුවිශේෂි බව කෙටියෙන් පැහැදිලි කරන්න.

    නැත්නම්,
    සාදාචාර දර්ශනයේ චිත්තවේගවාදි න්‍යාය විස්තර කරමින් සාකච්ජා කරන්න.

08. ආගම සහ ආචාරධර්ම අතර අවශ්‍ය වු සබඳතාවක් තිබේද යන්න විභාග කරන්න. (ඔබේ පිළිතුර තුළ එක් ආගමක් හෝ ආශ්‍රය කරගත යුතුයි)

09. ස්වච්ජන්දතාවය යන්න පහදා එය හා සම්බන්ධ වන්නා වු ආචාරධර්මීය ගැටලු සාකච්ජා කරන්න.

10. පහත මාතෘකා අතරින් <u>දෙකක්</u> පිළිබඳ කෙටි සටහන් ලියන්න.

i. ළමා අපයෝජනය සහ සදාචාර ගැටලු
ii. දේශපාලනය,ප්‍රචණ්ඩත්වය සහ සදාචාරය
iii. සත්ව ආරක්ෂාව හා සත්ව අයිතිවාසිකම්
iv. ගබ්සාව සහ සදාචාර ගැටලු
v. කාන්තාවන්ට එරෙහි ප්‍රචණ්ඩත්වය
vi. වෛද්‍ය ආචාරධර්ම

***************